මාධ්‍ය නිවේදන අංක **25**

**ජනාධිපතිවරණය - 2019 නොවැම්බර් 16**

**නාමයෝජනා පිළිබඳ තීරණ දැනුම් දීමේ නිවේදනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම, ධුරය දරන ජනාධිපතිවරයාගේ ධුරකාලය ඉකුත්වීමට පෙර මාසයකට අඩු නොවන සහ මාස දෙකකට වැඩි නොවන කාල සීමාවක් තුළ පැවැත්විය යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වැනි අනුව්‍යවස්ථාවේ නියමිතව ඇති හෙයින්ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ වැනි ව්‍යවස්ථාවේ සමඟ කියැවෙන, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 2 වැනි වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල අනුව, අංක 2141/25 සහ 2019 සැප්තැම්බර් මස 18 වන බදාදා දින ප්‍රසිද්ධියට පත්කරන ලද රජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් 2019 ඔක්තෝම්බර් මස 07 වන දින ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන් නාමයෝජනා කිරීමේ දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

2019 ඔක්තෝම්බර් මස 06 වන දින මධ්‍යාහ්න 12.00 දක්වා ඇප මුදල් භාරගන්නා ලද අතර, එම කාල පරිච්ඡේදය තුළ, පිළිගත් දේශපාලන පක්ෂ විසින් යෝජනා කරන ලද අපේක්ෂකයන් 19 දෙනෙකු ද, වෙනත් දේශපාලන පක්ෂ වෙනුවෙන් යෝජනා කරනු ලබන අපේක්ෂකයන් 03 දෙනෙකු ද, ඡන්ද හිමියන් විසින් යෝජනා කරනු ලබන අපේක්ෂකයන් 19 දෙනෙකු ද, වශයෙන් අපේක්ෂකයන් 41 දෙනෙකු වෙනුවෙන් ඇප මුදල් භාරගන්නා ලදී.

එම ඇප මුදල් තැන්පත් කළ අපේක්ෂකයන් අතරින් පිළිගත් දේශපාලන පක්ෂ 18ක, වෙනත් දේශපාලන පක්ෂ දෙකක, ඡන්ද හිමියන් යෝජනා කරනු ලබන අපේක්ෂකයන් 15 දෙනෙකුගේ, නාමයෝජනා පත්‍ර 35ක් අද දින පෙරවරු 09.00 සිට පෙරවරු 11 දක්වා මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදෙන ලද අතර, අපේක්ෂකයන් 06 දෙනෙකු නාමයෝජනා පත්‍ර භාර නොදෙන ලදී. අද දිනයේ දී භාරදුන් නාමයෝජනා පත්‍ර 35ම පිළිගන්නා ලදී.

ඒ අනුව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හෙවත් ජනාධිපතිවරණය 2019 නොවැම්බර් මස 16 වන දින පැවැත්වේ.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2019 ඔක්තෝම්බර් මස 07

## නාමයෝජනා පිළිගත් අපේක්ෂක නාමලේඛනය

| අනු අංකය | අපේක්ෂකයාගේ නම | පක්ෂය |
|---|---|---|
| 01. | කැටගොඩ ගමගේ ජයන්ත පෙරේරා මහතා | ස්වාධීන |
| 02. | සිරිපාල අමරසිංහ මහතා | ස්වාධීන |
| 03. | අජන්තා විජේසිංහ පෙරේරා මහත්මිය | ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය |
| 04 | අපරැක්කේ පුඤ්ඤානන්ද හිමි | ස්වාධීන |
| 05. | වැලිසරගේ සමන් ප්‍රසන්න පෙරේරා මහතා | අපේ ජන බල පක්ෂය |
| 06. | නන්දසේන ගෝඨාභය රාජපක්ෂ මහතා | ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ |
| 07. | ආරියවංශ දිසානායක මහතා | ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ |
| 08. | සිරිතුංග ජයසූරිය මහතා | එක්සත් සමාජවාදී පක්ෂය |
| 09. | වර්ණකුලසූරිය මිල්රෝයි සර්පියස් ප්‍රනාන්දු මහතා | ස්වාධීන |
| 10. | බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා | නව සම සමාජ පක්ෂය |
| 11. | නම්බුනාම නානායක්කාර අක්මීමන පල්ලියගුරුගේ වජිරපානි විජේසිරිවර්ධන මහතා | සමාජවාදී සමානතා පක්ෂය |
| 12. | සරත් මනමේන්ද්‍ර මහතා | නව සිහළ උරුමය |
| 13. | පල්ලෙවත්ත ගමරාලලාගේ රොහාන් පල්ලෙවත්ත මහතා | ජාතික සංවර්ධන පෙරමුණ |
| 14. | අනුර කුමාර දිසානායක මහතා | * ජාතික ජනබල ව්‍යාපාරය |
| 15. | චන්ද්‍රසේකර හේරත් හිටිහාමි කෝරලලාගේ සමන්සිරි හේරත් මහතා | ස්වාධීන |
| 16. | වැලේරා කීර්තිරත්න මුදියන්සේලාගේ සරත් විජිතකුමාර කීර්තිරත්න මහතා | ස්වාධීන |
| 17. | පොල්ගම්පල රාලලාගේ චමින්ද අනුරුද්ධ මහතා | ස්වාධීන |
| 18. | සමරවීර වීරවන්නි මහතා | ස්වාධීන |

| | | |
|---|---|---|
| 19. | අශෝක වඩිගමංගාව මහතා | ස්වාධීන |
| 20. | ඒ.එස්.පී.ලියනගේ මහතා | ශ්‍රී ලංකා කම්කරු පක්ෂය |
| 21. | බත්තරමුල්ලේ සීලරතන හිමි | ජන සෙත පෙරමුණ |
| 22. | සජිත් ප්‍රේමදාස මහතා | නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ |
| 23. | ඉල්ලියාස් අයිද්‍රූස් මොහමඩ් මහතා | ස්වාධීන |
| 24. | විජේනායක කංකානම්ගේ පියසිරි විජේනායක මහතා | ස්වාධීන |
| 25. | දුමින්ද නාගමුව මහතා | පෙරටුගාමී සමාජවාදී පක්ෂය |
| 26. | රජීව විජේසිංහ මහතා | ස්වාධීන |
| 27. | මහේෂ් සේනානායක මහතා | ජාතික ජනතා පක්ෂය |
| 28. | අරුණ ද සොයිසා මහතා | ප්‍රජාතන්ත්‍රවාදී ජාතික ව්‍යාපාරය |
| 29. | අජන්ත ද සොයිසා මහතා | *රුහුණු ජනතා පෙරමුණ |
| 30. | ප්‍රියන්ත මුණිහත් එදිරිසිංහ මහතා | ඔක්කොම වැසියෝ ඔක්කොම රජවරු සංවිධානය |
| 31. | නාමල් රාජපක්ෂ මහතා | ජාතික සමගි පෙරරමුණ |
| 32. | එම්.කේ.සිවාජිලිංගම් මහතා | ස්වාධීන |
| 33. | මහ්මුද් ලෙබ්බෙ ආලිම් මුහම්මද් හිස්බුල්ලාහ් මහතා | ස්වාධීන |
| 34. | අහමඩ් හසන් මොහොමඩ් අලවි මහතා | ස්වාධීන |
| 35 | සුබ්‍රමනියම් ගුණරත්නම් මහතා | අපේ ජාතික පෙරමුණ |

## නාමයෝජනා භාර නොදුන් අපේක්ෂක නාමලේඛනය

| අනු අංකය | අපේක්ෂකයාගේ නම | පක්ෂය |
|---|---|---|
| 01. | බෂීර් සේගුදාවුද් මහතා | ස්වාධීන |
| 02. | ජයන්ත ලියනගේ මහතා | සිංහලදීප ජාතික පෙරමුණ |
| 03. | ශාන්ත කුමාර ආනන්ද වෙල්ගම මහතා | ස්වාධීන |
| 04. | වමල් ජයන්ත රාජපක්ෂ මහතා | ශ්‍රී ලංකා නිදහස් පොදුජන සන්ධානය |
| 05. | ගුණපාල තිස්සකුට්ටිආරච්චි මහතා | ස්වාධීන |
| 06. | ගනේ ආරච්චිගේ මහීපාල හේරත් මහතා | ස්වාධීන |